# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 17 දරන
# ශ්‍රී ලංකා තේ මණ්ඩල
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 මැයි මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 මැයි මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : ශත 60 යි　　　තැපැල් ගාස්තුව : ශත 60 යි

**1985 අංක 17 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1985 මැයි මස 10 වන දින.]

එල්. ඩී.—ඕ. 23/84.

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1985 අංක 17 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 6 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**" මණ්ඩලයේ සංයුතිය.**

6. (1) මණ්ඩලය,—

(අ) අග්‍රාමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, මණ්ඩලයෙහි ප්‍රධාන විධායක විය යුතු, සභාපතිවරයකුගෙන් ;

(ආ) ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යාංශයෙහි ලේකම්වරයා වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තාගෙන්, හෝ ඒ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයෙහි යම් ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන් ;

(ඇ) මුදල් විෂයය භාර අමාත්‍යාංශයෙහි ලේකම්වරයා වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තාගෙන්, හෝ ඒ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයෙහි යම් ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන් ;

(ඈ) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යාංශයෙහි ලේකම්වරයා වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තාගෙන්, හෝ ඒ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයෙහි යම් ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන් ;

(ඉ) වෙළෙඳ විෂයය භාර අමාත්‍යාංශයෙහි ලේකම්වරයා වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තාගෙන්, හෝ ඒ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයෙහි යම් ජ්‍යෙෂ්ඨ නිලධරයකුගෙන් ;

ඒ 082822—6,750 (85/03)

(ඊ) නාවික කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යාංශයෙහි ලේකම්වරයා වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තා ගෙන් ; හෝ ඒ අමාත්‍යාංශය භාරව සිටින අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයෙහි යම් ජ්‍යෙෂ්ඨ නිලධරයකු ගෙන් ;

(උ) වාණිජ අධ්‍යක්ෂවරයා වශයෙන් තත් කාල යෙහි ධුරය දරන තැනැත්තාගෙන් ;

(ඌ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සභාපති වරයා වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තාගෙන් ;

(එ) රාජ්‍ය වැවිලි සංස්ථාවේ සභාපතිවරයා වශ යෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තාගෙන් ;

(ඒ) කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තාගෙන් ;

(ඔ) අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති වරයා වශයෙන් තත් කාලයෙහි ධුරය දරන තැනැත්තාගෙන් ; සහ

(ඕ) තේ කර්මාන්ත විෂයයෙහි, විශේෂයෙන් වගා කිරීම, නිෂ්පාදනය කිරීම, විකිණීම, අපනයනය කිරීම හා මුදල් කටයුතු පිළි බඳව දැනීමක් හා පළපුරුද්දක් ඇති තැනැත්තන් අතුරින්, අග්‍රාමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, වෙනත් සාමාජිකයන් පස් දෙනෙකුගෙන්

සමන්විත විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"විශ්‍රාම වැටුප් ලබන්නා වූ ද මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කර ගනු ලබන්නා වූ ද තැනැත්තන්ට අදාළ වන්නා වූ විධිවිධාන.

23. මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කර ගනු ලබන්නා වූ යම් තැනැත්තකු, ආණ්ඩුවෙන් හෝ යම් පළාත් පාලන ආයතනයකින් හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාවෙන් හෝ විශ්‍රාම වැටුපක් ලැබීමට, එම සේවා නියුක්තියේ හේතු වෙන් නුසුදුස්සකු නොවිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" වැරදි. 24. මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන සෑම තැනැත්තකුම, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, මහෙස්ත්‍රාත්වරයකුගේ සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කල හැකි දඩය ඉක්මවන්නේ වුවද රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ "පළාත් පාලන ආයතනය" යන යෙදුමෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ සංවර්ධන සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටුකරන බලතල වලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියක් මගින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.